රජයේ නිවේදන

1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත

3 වැනි වගන්තිය යටතේ නියමය

සංශෝධිත පරිදි, 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙම නියෝගය මගින් එම වගන්තිය යටතේ පනවන ලද 2019 අගෝස්තු මස 10 දිනැති අංක 2135/68 දරන අති විශෂ ගැසට් නිවේදනය මගින් අවසන්වරට සංශෝධිත 2019 මාර්තු මස 05 වැනි දිනැති අංක 2113/9 දරන අති විශෙෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලද උපලේඛනය (II), පහත උපලේඛනයේ දක්වා ඇති පරිදි සංශෝධනය කරමි.

මහින්ද රාජපක්ෂ,
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය.

2020 මාර්තු මස ..06.. වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

උපලේඛනය

2019 මාර්තු මස 05 වැනි දිනැති අංක 2113/9 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ II වන උප ලේඛනයෙහි අයිතම 7 ට පසු පහත සඳහන් අයිතමය ඇතුළත් කරමි.

| අංකය I | විස්තරය II | නිෂ්පාදන බද්ද III |
| --- | --- | --- |
| 8. | දේශීය බලයලත් නියෝජිතයකු විසින් විදේශීය සැපයුම්කරු සඳහා විවෘත කරන ලද සංගෘහිත ණයවර ලිපියක් මගින් ආනයනය කරන ලද, එකී ණයවර ලිපිය ඕනෑම පුද්ගලයකු විසින් එකී දේශීය බලයලත් නියෝජිතයා සඳහා 2018 සැප්තැම්බර් මස 30 දින හෝ එදිනට පෙර විවෘත කරන දේශීය ණයවර ලිපියක් පදනම්ව විවෘත කරන ලදුව සහ 2020 මැයි මස 31 දින හෝ එදිනට පෙර ශ්‍රී ලංකා රේගුවෙන් නිෂ්කාශනය කරනු ලබන ඕනෑම මෝටර් රථයක්/රථ | ගෙවිය යුතු බද්ද හෝ සංශෝධිත පරිදි 2017 නොවැම්බර් 09 දිනැති අංක 2044/32 දරන ගැසට් නිවේදනයේ නිශ්චිතව දක්වා ඇති බදු අනුපාතය යන දෙකෙන් එම මෝටර් රථයේ/ රථ ආනයනකරු විසින් තීරණය කරන ලද පරිදි |